**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2016**

------------------------------------------

පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිත විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1996 පෙබරවාරි 09 දිනැති අංක 909/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 1996 අංක 01 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියේ 21 වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2017 සැප්තැම්බර් 28 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය ව්‍යාවනය**

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---

රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර, ඉකුත් වසර ගණනාවක සිට ලැබී තිබුණු 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.161,109,893 ක රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන හිමිකම් යටතේ දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආයතනයට භාණ්ඩාගාරයෙන් හා ජාතික විද්‍යා පදනමෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබුණු රු.43,000,000 ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.15,000,000 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.28,000,000 ක ස්ථාවර තැන්පතු ආපසු ගැනීම මුදල් ගලා යෑමක් ලෙසද ආයෝජනය කළ රු.19,683,278 ක මුදල, මුදල් ගලා ඒමක් ලෙසද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ජංගම වත්කම් තුළ වූ වෙනත් වත්කම්වල වැඩිවීම රු.27,271,367 ක් මුදල් ගලා යෑමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දැක්වීම වෙනුවට රු. 274,044 ක මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගැලපුම් ගිණුමේ රු. 1,276,498 ක බැර ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ලාභයෙන් අඩුකර දක්වා තිබුණි.

(ඉ) රාජ්‍ය බැංකුවක "පී. අමරසිංහ ශිෂ්‍යත්ව අරමුදල" නමින් 2016 සැප්තැම්බර් 27 දින ආරම්භ කර ඇති ඉතිරි කිරීමේ ගිණුමේ වූ රු. 604,708 ක ශේෂය හා 2013 දෙසැම්බර් 09 දින ආරම්භ කර තිබුණු ස්ථාවර තැන්පතුවේ 2016 දෙසැම්බර් 31 දිනට වූ රු. 428,651 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

එකතුව රු. 80,141,656 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| -------- | ------------ | ------------------------------- |
| | රු. | |
| (අ) පර්යේෂණ ව්‍යාපෘති සඳහා මිලදී ගන්නා ලද රසායනික ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ | 3,121,993 | තොග පොත් හා ඉන්වෙන්ට්‍රි ලේඛන |
| (ආ) GIS (භූ විද්‍යා තොරතුරු පද්ධති) කෙටිකාලීන පාඨමාලා 09 ක් | 2,356,138 | පාඨමාලා පැවැත්වූ බවට තොරතුරු |
| (ඇ) ස්ථිර තැන්පත් අවලංගු කර අයථා ලෙස මුදල් ලබා ගැනීම හේතුවෙන් අහිමි වූ පොලිය ඇතුළුව අරමුදලට සිදු වූ පාඩුව | 74,663,525 | 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අදාළ සමස්ථ පාඩුව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර තිබූ ගැලපීම් පිළිබඳ තොරතුරු |
| | --------------- | |
| | 80,141,656 | |
| | ========= | |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ------------------------------------- | ------------------- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------------------- | |
| (i) මුදල් රෙගුලාසි 135 | අභ්‍යන්තර පරීක්ෂාවක් වන පරිදි මූල්‍ය කටයුතු සඳහා පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතු වුවත්, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නමින් ඇති සියලුම ස්ථිර තැන්පත් සහතික භාරයේ පැවැත්වීම, එම සහතික අලුත් කිරීම, මුදල් කිරීම හා ඊට අදාළ ලිපි සකස් කිරීම ඇතුළු සියලු කටයුතු මුදල් රෙගුලාසිවලට අනුකූල නොවන පරිදි 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම එකම නිලධාරියෙකු වෙත පවරා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 සංශෝධනය කිරීම යන මැයෙන් නිකුත් කරන ලද අංක 03/2015 හා 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | * අවස්ථා 07 කදී රු.100,000 ක සීමාව ඉක්මවා රු.114,000 ක සිට රු.176,800 ක් දක්වා පරාසයක් තුළ අත්තිකාරම් ලබා දී තිබුණි. |
| | * අවස්ථා 13 කදී අවශ්‍ය ප්‍රමාණයට වඩා සියයට 12 සිට සියයට 78 දක්වා ප්‍රමාණයක මුදල් ලබා දී තිබුණු අතර, එම අතිරික්ත මුදල් දින 07 සිට දින 77 දක්වා ප්‍රමාදයක් සහිතව පියවා තිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 757(2)(ආ) | 2016 වර්ෂයට අදාළව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලය පත්කර තිබුණ ද භාණ්ඩ සමීක්ෂණය අවසන් කර නොතිබුණි. |

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය

| | | |
|---|---|---|
| | II කොටසේ VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) වගන්ති | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගන්නා ගාස්තු ප්‍රමාණයෙන් සියයට 10 ක කොටසක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවද, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2016 වර්ෂය තුළ බාහිර කථිකාචාර්යවරුන් වෙත ගෙවන ලද රු.11,058,565 ක දේශන ගාස්තුවලින් සියයට 10 ක කොටස වූ රු.1,105,856 ක් ආයතන අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව රාජ්‍ය ආයතනයන්හි අතිරික්ත මුදල් ආයෝජනය කළ නොහැකි වුවත්, ඊට පටහැනිව පාලක මණ්ඩලයේ අනුමැතිය මත ආයතනය විසින් රු.89,174,895 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.17,917,356 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.26,173,802 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,256,446 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පාඨමාලා ගාස්තු ආදායම රු. 6,083,334 කින් වැඩිවුවද, සේවක පාරිශ්‍රමික රු.10,374,501 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබූ අතර, සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු.45,894,445 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී එය රු.85,828,243 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

1996 අංක 01 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව ආයතනයේ මූලික පරමාර්ථ කෙටියෙන් පහතින් දැක්වේ.

- විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විශිෂ්ට ආයතනයක් කිරීම.
- මූලික හා සංයුක්ත විද්‍යාත්මක පරීක්ෂණ සඳහා විශිෂ්ඨ ආයතනයක් බිහි කිරීම.
- සමාජයට විද්‍යාත්මක තොරතුරු ව්‍යාප්ත කිරීම.
- ඉහළ මූල්‍ය පරිපාලනමය කාර්යක්ෂමතාවයකින් හෙබි විශිෂ්ඨතම පශ්චාත් උපාධි ආයතනයක් කිරීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව 2016 වර්ෂයේ 14000 වන ස්ථානයට ළඟාවීමට ඉලක්ක කර තිබුණද, එහි 17314 වැනි ස්ථානය හිමිව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ නව පාඨමාලා 04 ක් හඳුන්වාදීමට ඉලක්ක කර තිබුණද, වර්ෂය තුළ ක්‍රියාත්මක තත්ත්වයට පත්කර තිබුණේ නව පාඨමාලා 02 ක් පමණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පර්යේෂණ කටයුතු වෙනුවෙන් ආයතන 07 කින් ඉකුත් වර්ෂවලදී ලැබී තිබුණු රු. 2,696,003 ක අරමුදල් අදාළ පර්යේෂණ කටයුතු සඳහා යෙදවීමට හෝ අදාළ ආයතන වෙත නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවශ්‍යතා හඳුනා නොගෙන මිලදී ගෙන තිබූ රු. 362,884 ක් වටිනා තොග අයිතම් 67 ක් වර්ෂයකට වැඩි කාලයක් භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් ආයතනය වෙත නිකුත් කර තිබූ රු.324,220 ක් වටිනා රසායනික ද්‍රව්‍ය, ආයතනයේ තොග පොත්වල ඇතුළත් නොකර ඍජුවම රසායනාගාරය වෙත නිකුත් කර තිබුණි.

### 4.4 අරමුදල් ඌන උපයෝජනය

---------------------------------

සමාලෝචිත වර්ෂය තුළ වත්කම් අත්පත්කර ගැනීම් යටතේ පොත් සහ වාර සඟරා මිලදී ගැනීම සඳහා වෙන් කර තිබූ රු.1,000,000 ක මුදලින් රු. 948,305 ක් එනම් සියයට 95 ක ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ V පරිච්ඡේදයේ 47 වගන්තිය පටහැනිව සේවක අර්ථසාධක අරමුදල් දායකය, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකය හා පාරිතෝෂික ගණනය කිරීමේදී අධ්‍යයන දීමනා අදාළ කර ගෙන ගණනය කිරීම හේතුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ආයතනයේ දායකය ලෙස රු.421,231 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ කාර්ය මණ්ඩලයේ තනතුරු 09 කට අදාළව ස්ථිර මහාචාර්යවරයෙකු, බාහිර මහාචාර්යවරුන් දෙදෙනෙකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු සහ පර්යේෂණ සහකාරවරයෙකු මෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 07 දෙනෙකු ඇතුළුව පුරප්පාඩු 11 ක් පැවතීම හේතුවෙන් ආයතනයේ අධ්‍යයන හා ආයතනික කටයුතු ප්‍රශස්ත අයුරින් ඉටුකර ගැනීමට බාධාවක්ව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාර ගිණුම් ඉදිරිපත් කිරීමේ කළමනාකරණයේ වගකීම පිළිබඳ සහතිකය මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය පරිදි කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගත් යාවත්කාලීන සංයුක්ත සැලැස්මේ පිටපතක් සෑම වර්ෂයක්ම ආරම්භවීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් ඉලක්ක දිනයන්හි ඉදිරිපත් කළ යුතු වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.4 විගණන කමිටු

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009(1) දරන කළමනාකරණ, විගණන චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාස 03 කට එක් වරක් හෝ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විෂයයන් 23 ක සියයට 23 සිට සියයට 103 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. |
| (ආ) | අරමුදල් උපයෝජනය | - | ප්‍රතිපාදිත අරමුදල් සම්පූර්ණයෙන්ම උපයෝජනය නොකිරීම. |
| (ඇ) | තොග හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පාලනය | - | ප්‍රමාණවත් පාලන ක්‍රම ස්ථාපිත කර පවත්වාගෙන නොතිබීම. |
| (ඈ) | මූල්‍ය කළමනාකරණය | (i) | ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත නොකිරීම හේතුවෙන් ආයතනයේ පැවති ස්ථාවර තැන්පතු අයථා පරිදි අවලංගු කර මුදල් පෞද්ගලික ගිණුම්වලට බැර කර ගැනීම. |
| | | (ii) | ආයතනයේ මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමේ දී හා ස්ථාවර තැන්පතු මුදල් ආපසු ලබාගැනීමේදී ඒ ඒ අවස්ථාවලදී පාලක මණ්ඩලයේ අනුමැතිය ලබානොගැනීම. |
| | | (iii) | ආයතනයේ මූල්‍ය තත්ත්වය කළමනාකරණ මණ්ඩලය වෙත වාර්තා නොකිරීම. |
| | | (iv) | නීති රීතිවලට පටහැනිව අරමුදල් ආයෝජනය කිරීම. |